

# කස්තිරම

## ඩී බී කුරුප්පු

# විප්‍රවාසී සිංහලයන් ගැන ලියැවෙයි

ඕස්ට්‍රේලියාවට පැමිණ ටික දිනක් ගත කළ සිංහල ලේඛකයෙක් මේ රට ''දුප්පතුන් නැති ලෝකය'' නමින් හැඳින්වීය. පෝලින් හැන්සන් ගේ 'වන් නේෂන්'' පක්ෂය ආදිවාසීන්ගේ අයිතිවාසිකම් සුරකින තුන්වැනි පක්ෂය වශයෙන් හැඳින්වූයේ ශ්‍රී ලංකාවේ පුවත්පතක විදේශ කටයුතු වාර්තාකරුවෙකි. *(සංස්කාරක සටහන -වන් නේෂන් යනු ඕස්ට්‍රේලියාවේ වර්ණ බේධය වපුරණ දේශපාලන පක්ෂයකි)*

ඒ එක පැත්තකි. අනෙක් පැත්ත මේ රටේ සිටින අපේම උදවිය මව්බිමේ ප්‍රශ්න විග්‍රහ කරන විසඳුම් යෝජනා කරන හැටි බැලූ කල්හි අනේ? මේ පින්වතුන් රටේම නැවතුණා නම් අපේ මව් බිමට කිරි ඉතිරෙනවා නොවේදැයි අපට සිතන්නට සිදුවෙයි.

මව්බිමෙන් කොතරම් දුරස්ව සිටියත්, සිංහල කතා කරන තාක්, සිංහල ලියන කියන තාක්, අපට රට අමතක කරන්නට ඉඩ නොලැබෙනු ඇත. සිංහලෙන් ලියන්නන් විශේෂයෙන්ම මව්බිම ගැන කල්පනා කළ යුතුය. බොහෝ දෙනා ලියන්නේ මව්බිම නැතහොත් මව්බිමේ මිනිසුන් හා සිදුවීම් ගැනය. එසේ නොවුවත්, අප ලියන දේ මව්බිමේ සිටින අය නොකියවතොත් අපගේ පාඨක පිරිස් අතලොස්සකට සීමා වන්නටද බැරි නැත.
මේ රටේ වාසය කරන අපේ ලේඛකයන්ගේ

*මෙම නව කතාවේ කතා නායකයා සිංහල මාපියන්ට දාව එංගලන්තයෙ උපන් විසි හැවිරිදි තරුණයෙකි. දෙමාපියන් ඔහු ද රැගෙන ඕස්ට්‍රේලියාවට පැමිණි පසු ඔහු ගත කරන්නේ බෙහෙවින් හුදකලා ජීවිතයකි.*

කෙටි කතා, නව කතා දෙවර්ගයෙන්ම බොහෝවිට ශ්‍රී ලංකාවේ සමාජය හා ජීවිතය නිරූපනය වන්නේය. අප මෙහි ගත කරන ජීවිතය ශ්‍රී ලංකාවේ වාසය කරන අපේ ම ලේඛකයන්ගේ කෘතීන්ට පදනම් වන අවස්ථා තවමත් විරල යයි සිතමි. මෙය ලියන්නට අදහස් කළේ එබඳු විරල අවස්ථාවක් සහ එබන්දන් අප ගැන දක්වන ආකල්පය පෙන්වා දීමටය.

''පුණ්නපී පොඩි හාමුදුරුවෝ' නමින් නව කතාවක් ලියා මෙල්බර්න් පන්සක පලහිලව්වක් ඉදිරිපත් කළ ලේඛකයෙකු වූ ඩී.බී. දිසානායක ගැන කලින් ලිපියක සඳහන් කළෙමි. ඔහු මෙරටට පැමිණ නිවාඩුවක් ගත කළ බව ද කීවෙමි. ඔහු ගත කළ නිවාඩුව ඔස්සේ පාඨකයා වෙත ඉදිරිපත් කැරුනු ඔහුගේ දෙවැනි නව කතාව කියවීමට මට ලැබුණේ නොබෝදාය. 'අක්මුල් නැති මිනිස්සු' නමැති එම නව කතාව පළවූයේ 2005 දීය.

නව කතාවක් වශයෙන් එතරම් ගැඹුරක් මෙහි භාෂාව අතින් සෑහෙන මට්ටමක් හෝ මම එහි නොදනිමි. එහෙත් කතාවට පෙරත් කතාව ඔස්සේත් ඔහු පළ කරන අදහස් ඕස්ට්‍රේලියාවාසී (පොදුවේ බටහිර රටවල වෙසෙන) සිංහලයන්ටත් විශේෂයෙන් සිංහල ලේඛකයන්ටත් වැදගත් යයි, සිතමි. වැදගත් වනුයේ ඒ ගැන හිතා බැලීම අවශ්‍ය නිසාය.

ඔහු දක්වන අදහස් නොහොත් මත පිලිබඳව මා දරන අදහස් නොදක්වන්නේ, එසේ කිරීමෙන් පාඨකයාට ස්වාධීනව නිගමනයකට බැසීමට අවහිරයක් නොකරනු පිණිස ය. ''කර්තෘගෙන්'' යනුවෙන් පොතෙහි එන පෙර වදනේ ඡේද දෙකක් උපුටා දක්වමි.

''මොවුන් බොහෝදෙනා 'ළිදෙන් වතුර බී මූදට ආවඩන්නෝය.'' ඒ ඔවුන්ගේ මුදුන් මල් සිඳී ගිය හෙයිනි. විදේශ ගත වන බොහෝදෙනාට ඉතාමත් ටික කාලයටකින් තමා උපන්, හැදී වැඩුනු, නොමිලේ ඉගෙන ගත් රට අප්‍රියය. ජුගුප්සා ජනකය. අපිරිසිදුය.

සමහරුන් තම දරුවන් මෙරටට නොගෙනෙන්නේ මේ රට මැසි මදුරුවන් සිටින අපිරිසිදු රටක් නිසා වෙතැයි කටමත දොඩන්නෝය. කිසිදු හිරිකිතයකින්ද තොරවය.
''අන්තිමේදී මොවුන්ගේ අනාගත පරපුරට මේ රටත් අහිමි වන අතර, ඒ රටවල ඔවුන් බාල්දු වන දෙවැනි පුරවැසියන් බවට පත්වන බවක් මේ ඔලමොට්ටල යන්ට නොතේරේ. ඒ ඔවුන්ගේ හිස් කබල් තුළ ඇත්තේ ඇණ මුරිච්චි සවි කිරීමට හා ඒවා ක්‍රියාත්මක කරවීමට පමණක් ක්‍රියාත්මක කළ හැකි අවයවයක් පමණක් මිස, එයට චින්තනය නුපුරුදු හෙයිනැයි සිතමි.''

තමාගේ මේ නිර්දය විවේනය රට ගිය සෑමටම නොවන බව කියන ලේඛකයා ''මේ මිහිතලයේ කොතකා සටියත්, හෙළ බස, දෙස හා රැස අගයන්නට තම දූ පුතුන්ට උගන්වන හෙළයන් ද' ඇති බව සඳහන් කරයි.

මෙම නව කතාවේ කතා නායකයා සිංහල මාපියන්ට දාව එංගලන්තයෙ උපන් විසි හැවිරිදි තරුණයෙකි. දෙමාපියන් ඔහු ද රැගෙන ඕස්ට්‍රේලියාවට පැමිණි පසු ඔහු ගත කරන්නේ බෙහෙවින් හුදකලා ජීවිතයකි. පියාගෙන් වෙන් වූ මව සමගය. කිසි දිනක ශ්‍රී ලංකාවට නොගිය ඔහු දෙමාපියන්ගෙන් ඔබ්බට පරපුර ගැන නොදත්තේය. පාසැලේ මුණ ගැසෙන ශ්‍රී ලාංකික දෙමළ ශිෂ්‍යාවක නිසා තම පරපුර ගැනත් මව්බිම ගැනත් දැන ගැනීමට ආසාවක් ඔහු තුළ හට ගැනිණි. පියා සමඟ ශ්‍රී ලංකාවට යන ඔහු පැරණි රාජධාරි දැකීමෙන් හා රටේ ස්වභාවික සෞන්දර්යයෙන් ප්‍රබෝධයට පත්වෙයි. වසරකට වරක් ශ්‍රී ලංකාව බලා යන ඔහුගේ දෙමළ මිතුරිය කොළඹ දී මුණ ගැසමෙන් පසු කතාව අවසන් වන්නේ මෙසේය.

''රාජිනී ඔයා හැමදාම මගේම වෙනවාදැයි රොඩ්නි තොල මැතුරුවේ ඇගේ ලඟින් විදිහෙන ආදරයේ නැවුම් සුවඳින් වශී වෙලා වගේ.''
''ඔව්, රොඩ්නි මම හැමදාම ඔයාගෙම වෙන්නම්. ඊට පස්සේ අපි ලස්සන ජීවිතයක් ගොඩ නගා ගෙන ලංකාවට ඇවිත් කවදා හරි පදිංචි වෙමු'' යි රාජිනී පැවසුවේ ඔහුගේ නලල සිප ගනිමිනි.''
ඊට කලින් අනුරාධපුර ඇති පැරණි නගර නරඹා පැමිණි තරුණයා - රොඩ්නි - කොතරම් ඉක්මනට කොතරම් වෙනස් වූවාදැයි ඔහු තම පියාගේ සොහොයුරියට කියන මෙම වචන වලින් පැහැදිලි වෙයි.

''පොඩි නැන්දේ, අපි ඉන්න රට විශාල එකක්. ඒත් කිලෝමීටර් දාස් ගණන් ගියත් මේ වාගේ නිර්මාණ දකින්න නැහැ. ඉතිහාසය ගැන ආඩම්බර වෙන්න තරම් දෙයක් නැහැ. ඒ හින්දම වෙන්න ඇති එහේ මිනිසුන්ගේ නම් කෙටි වෙන්න ඇත්තේ. වොට්සන්. කෙවින් වගේ. ඉතින් අපේ අප්පච්චිලත් තමුන්ගේ උරුමය ගැන නොදැන හිටිය නිසා එංගලන්තයේ ගියාම පා වෙන්න ඇති. අන්තිමට එයාලට අගක් නෑ. මුලක් නෑ. ලෝකෙට පෙන්න ඔහේ ජීවත් වෙනවා. බොරු පුරාජේරුව විතරයි. ඇතුල හිස්.''

ඊට කලින් ඔහු නැන්දා සමග පියාට කරන චෝදනාවක්

''ඔන්න බලන්න පොඩි නැන්දේ මගේ මමා ආයෙම මට කතා කළේ රොඩ්නි කියලයි.'' මියගිය තමාගේ පියා සිහි කොට හඬන නැන්දා ළඟට එන මිණිබිරිය ''ඇයි ආච්චි අම්මේ අඬන්නේඩ යි විමසයි.

''නෑ දුවේ ආච්චි අම්මට ටිකක් දුක හිතුණා'' යි කියමින් මිරිබිරිය සැනසූ ඇය ඉකිබිඳුම නරත කිරීමට හැකි පමණ වෑයම් කළාය.
එය දකින රොඩ්නි ගැන කතුවරයා කරන විස්තරය මෙසේය.

'මෙ දෙස බලා සිටි රොඩ්නිගේ සිත තුළ තමා බාල නැන්දනිය කෙරේ අප්‍රමාණ සෙනෙහසක් ඉපදුණි. ඇය ඇගේ මිනිබිරියගේ සතුට වෙනුවෙන් තම දුක ආයාසයෙන් යටපත් කර ගත් අයුරු කෙතරම් ශ්‍රේෂ්ටයිද? බුර බුරා නැගී ආ දුක හදවතේ ගැඹුරට භාර දී මතු පිට මුහුණින් ඒ නොදරුවාට සෙනෙහස පෙන්වීම කෙතරම් විස්මය ජනකද? ඒත් මගේ පියා තුළ මෙබඳු යහපත් නොපිහිටියේ මන්ද? ඔහු මේ ශ්‍රේෂ්ඨ සංස්කෘතියේ මුල් නොඇදහූ හින්දා වෙන්න ඇති. රොඩ්නි තනියම කල්පනා කළා.

රොඩ්නි තුළ ඇති වූ වෙනස ඔහුගේ වචනයෙන්ම මෙසේ දැක්වෙයි.

''ඔව් අප්පච්චි, මම දැන් ලංකාවට මීට මාසයකට ඉස්සර ආපු රොඩ්නි නෙවෙයි. මම දැන් දන්නවා, මට පරපුරක් හිටියා කියලා. ඒ පරපුරේ ඉතිහාසයක් තියෙනවා. ඒවා නිකංම නිකං කියවන දේව වාක්‍ය වගේ නෙවෙයි. අනුරාධපුරේ, පොලොන්නරුවේ වගේ තැන්වල ඒවා ජීවමාන වෙනවා. දැන් මගේ නම විතරයි රොඩ්නි.

ඩී.බී. කුරුප්පු

## ඩැන්ඩිනොන් ධර්මදීපාරාම විහාරයේ වෙසක් පහන් කූඩුව



ඩැන්ඩිනොන් ධර්මදීපාරාම විහාරයේ වෙසක් උත්සවය වෙනුවෙන් තනවා ඇති දර්ශණීය වෙසක් කූඩුව කාගේත් සිත් ඇදගත් අංගයක් විය. පරිවාර කූඩු 51 ක් සහිත මහ කූඩුව තුන් ආකාරයකට කැරකෙයි. කූඩු 54 ක් සහිතව මැද මාලයේ කූඩු 30ක් ද ඇති මේ පහන් කූඩුව විදුලි බල්බ 2500 කින් ආලෙක්කෙවත් වී ඇත. දර්ශණීය කැටයම් සහිතව චුල්ල පදුම ජාතකය විදහා දක්වන මහා වෙසක් පහන්කූඩු රාජයා නිර්මාණය කළේ නිමල් වීරතුංග මහතා සහ පිරිසයි. චිත්‍ර හසන් කුමාරසිරි මහතාගේ ය.

සේයාරුව රංගන බෝපගේ




සැවැත් නුවර විශාඛා මහ උපාසිකාවගේ මාළිගයෙහි දිනපතා මහ සඟනට දානය සහ ගිලන් පස පිළිගන්වති. දානමාන කටයුතු කරන අය අතර, විශාඛා උපාසිකාවගේ මිණිබිරිය ''දත්තා'' අන් අයට වඩා සූර ලෙස කඩිසර ලෙස මහත් භක්තියෙන් ඒ ඒ කටයුතු කරන්නී ය. දත්තා තුරුණු වියෙහිම මරු වසඟට විය. මෙයින් විශාඛා මහ උපාසිකාව මහත් සෝක වන්නී ය. බුදු හිමියන් බැහැ දැකීමට ගොස් ද මහත් ශෝකයෙන් සිටින්නී ය. මේ දුටු බුදුහිමියන් වහන්සේ උපාසිකාවන් අමතා මෙසේ ඇසී ය.
බුදුපියාණන් වහන්සේ - විශාඛාවෙනි, නිතරම ශෝකයෙන්ම සිටින්නේ ඇයි?

විශාඛා උපාසිකාව - බුදුපියාණන් වහන්ස, දත්තාගේ ගුණ සිහිවන විට සිතෙහි දුක බලවත් වේ.

බුදුපියාණන් වහන්සේ - විශාඛාවෙනි, මේ සැවැත්නුවර මිනිස්සු කොපමණ ඇද්ද?

විශාඛා උපාසිකාව - සත් කෙළක් පමණ ඇත.

බුදුපියාණන් වහන්සේ - ඒ සත් කෙළම ඔබගේ මිණිබිරියෝ වෙන්නේ නම් ඔබ කැමතිද?

විශාඛා උපාසිකාව - එසේය බුදුපියාණන් වහන්ස. මම මහත් කැමැත්තෙමි.

බුදුපියාණන් වහන්සේ - මේ සැවැත් නුවර දිනපතාම මියයන මිනිස්සු කොපමණද?

විශාඛා උපාසිකාව - දිනපතාම මිය යන්නෝ බොහෝය ස්වාමිණී.

බුදුපියාණන් වහන්සේ - මේ නුවර වැස්සෝ ඔබ මිණිපිරිය හා සමාන වෙත් නම්, දිනපතා මැරෙන ඒ අය බොහෝ වෙත් නම්, ඒ මරණ සඳහා සෝකවීම හැර වෙනත් දෙයක් ඔබට නැතැයි වදාළ සේක.

මේ සිදුවීම නිමිති කරගෙන ප්‍රේමය නිසා සෝකවීම හා බිය උපදින බවත්, ප්‍රේමයෙන් වෙන්වූ තැනැත්තාට (රහතුන් වහන්සේලාට) සෝකවීමක් හෝ බියවීමක් නැති බවත් වදාර) විශාඛා මහා උපාසිකාවගේ සෝකය නැතිකර සැනසූ සේක.